**“Lanka Women e-Market”** කාන්තා ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන මාර්ගගත වේදිකාවක් හරහා ප්‍රවර්ධනය කිරීම සඳහා එළිදක්වන ලද ඩිජිටල් අලෙවිකරණ වේදිකාව

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය මගින් ව්‍යවසායක කාන්තාවන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සහ ඔවුන් ආර්ථිකව සවිබල ගැන්වීම අරමුණු කර ගනිමින් නිර්මාණය කරන ලද ඩිජිටල් අලෙවිකරණ වේදිකාව “Lanka Women e-Market” හරහා ව්‍යවසායක කාන්තාවන්ගේ වෙළඳපොල අවස්ථා පුළුල් කිරීමටත් ඔවුන්ගේ නිෂ්පාදන හා සේවාවන් දේශීය මෙන්ම අන්තරජාතික වෙළඳපොලෙහි ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමටත් අවස්ථාව සලසා ඇත.

රජය මගින් විශේෂයෙන් කාන්තාවන් ඉලක්ක කරගනිමින් පවත්වාගෙන යන මෙම සේවාවේ මාර්ගගත පද්ධතියට පහත පරිදි පිවිස වැඩිදුර විස්තර හා ලියාපදිංචි වීමේ අයදුම්පත් බාගත කර ගැනීමට හැකිය.

1. https://lankawomenemarket.gov.lk/
   Lanka Women e-Market සබැඳිය ඔස්සේ හා
2. http://www.childwomenmin.gov.lk/services/lanka-women-e-market
   කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවි සබැඳිය ඔස්සේ